# සාන්ත ආනා සහ ජුවකීනු මුනිවරු
## අනිවාර්ය අනුස්මරණය

## පළමුවන දේව ප්‍රකාශනය — උපදේශකයා 44: 1, 10–15

*උපදේශකයා හෙවත් සිරාක්ගේ පොතෙන් උපටා ගත් කොටසකි.*

"පරපුරෙන් පරපුරට ඔවුන්ගේ නාමය පවතිනු ඇත."

පරපුරෙන් පරපුරට පැමිණි අපගේ ආදි පියවරුන් වන සත්කීර්තිමත් මිනිසුන් පැසසීම අපි දැන් අරඹමු. එහෙත් මෙන්න, සත්ගුණවත් මිනිසුන්ගේ නාමාවලියක් ඔවුන්ගේ සාධු ක්‍රියා අමතක වී ගොස් නැත. ඔවුන්ගේ පරපුරෙන් පැවතෙන අය අතර, ඔවුන්ගෙන් ජනිත, වටිනා ප්‍රවේණියක් ඇති වන්නේ ය. ඔවුන්ගෙන් පැවතෙන්නෝ ගිවිසුම්වලට ගරු කරති. ඔවුන් නිසා ඔවුන්ගේ දරුවන්ගේ දරුවෝ ද එලෙස කරති. ඔවුන්ගේ දරුදැරියෝ සදා පවතින්නෝ ය. ඔවුන්ගේ මහිමය මලානික නොවනු ඇත. ඔවුන්ගේ මළසිරුරු සාමයෙන් වළලන ලදී. පරපුරෙන් පරපුරට ඔවුන්ගේ නාමය පවතිනු ඇත. සෙනඟ ඔවුන්ගේ ප්‍රඥාව පවසන්නෝ ය. සභාව ඔවුන් ගැන පසස් ගී ගයන්නී ය.

දේව වචනය මෙසේ ය.

## පිළිතුරු ගීය — ගීතාවලිය 132: 11, 13–14, 17–18

පිළිතුර : දෙවි සමිඳාණෝ දාවිත්ගේ සිංහාසනය උන් වහන්සේට ප්‍රදානය කරන සේක.

ගීය : සමිඳාණෝ සැබැවින් ම දාවිත්ට මෙලෙස දිවුළ සේක:
"නුඹේ ම කුමරෙකු නුඹේ සිහසුනට පත් කරන්නෙමි."

සමිඳාණෝ සියොන් තෝරාගත් සේක.
සිය වාසභවනය ලෙස ඊට කැමැති වූ සේක.
මෙය සදාකල් ම මාගේ වාසස්ථානය වේ.
මම මෙහි වැඩ වසන්නෙමි: මම ඊට කැමැති වෙමි.

එහි දාවිත්ගෙන් පැවතෙන්නෙකු බලවත් රජෙකු කරන්නෙමි.
මාගේ අභිෂේක ලත් තැනැත්තාට
පහනක් මෙන් දිලෙන්නට සලසන්නෙමි.
ඔහුගේ සතුරන් ලජ්ජාවට පත් කරන්නෙමි.
එහෙත්, ඔහු මත ඔහුගේ කිරුළ බබළන්නේ ය.

## සුපුවත් ජය නද ලූක් 2: 25

ආලේලූයා! ආලේලූයා!
ඔව්හු ඉශ්රායෙල්වරුන්ගේ විමුක්තිය අපේක්ෂාවෙන් සිටියහ.
ශුද්ධාත්මයාණෝ ඔවුන් කෙරෙහි වැඩ සිටි සේක.
ආලේලූයා!

## සුවිශේෂය මතෙව් 13: 16–17

*සුවිශේෂක මතෙව් තුමාගේ ශුද්ධ වූ සුවිශේෂයෙන් උපුටා ගත් කොටසකි.*

"ඔබ දකින දේ දැකීමට බොහෝ දැහැමි අය ආශාවෙන් සිටියහ."

ජේසුස් ස්වාමින් වහන්සේ සිය ශ්‍රාවකයන්ට මෙසේ වදාළ සේක: "එහෙත්, ඔබට ඇසින් පෙනෙන නිසා ද, කනින් ඇසෙන නිසා ද, ඔබ භාග්‍යවන්ත ය. සැබැවින් ම මම ඔබට කියමි, බොහෝ දිවැසිවරයන් ද දැහැමි අය ද ඔබ දකින දේ දකින්නටත්, අසන දේ අසන්නටත් ආසා වූ නමුත්, ඔවුන් ඒවා දුටුවේ වත් ඇසුවේ වත් නැත."

*සමිඳාණන් වහන්සේගේ සුභාරංචිය මෙසේ ය.*